# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1820/4 - 2013 ජූලි මස 23 වැනි අඟහරුවාදා - 2013.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 01

2012.09.27 දින හා අංක 1777/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර තිබේ.

(i) 7 වන වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

III ශ්‍රේණියට අදාළ නිලධාරීන් පත් කිරීම.

පහත 8 වගන්තියේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන අය සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කරනු ඇත.

(ii) 10.5 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

පත්වීම් දින සිට වසර 05ක් ඇතුළත දෙවන භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ප්‍රාරම්භක කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණය සමත් විය යුතුය.) නියමිත කාලය තුළ ප්‍රවීණතාවය ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක නතර කෙරේ.

(iii) 14 (ii) වගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ.

(අ) පහත (ආ) වගන්තියේ සුදුසුකම් සම්පූර්ණ කර නැති II පන්තියේ සේවකයන් (ii) ශ්‍රේණියට ;

(අ) මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට, II පන්තියේ වසර නවය (09)ක අඛණ්ඩ සේවා කාලයක් සහිත, අංක 1258/20 හා 2002.10.18 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද කාර්යාල සේවක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11.1 ඡේදයේ (i) හා (ii) හි දැක්වෙන සුදුසුකම් සපුරාලන ලද නිලධාරීන් මෙම ව්‍යවස්ථාවට ක්‍රියාත්මක වන දින සිට I ශ්‍රේණියට.

1A - PG 001695 — 810 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(iv) 17 වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

අන්තර් කාලීන විධිවිධාන

සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ I පන්තියට උසස් වී සිටින නිලධරයන් I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ. දැනට සේවයේ සිටින නිලධරයන් සඳහා කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් වීමට මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ සිට වසර 03ක සහන කාලයක් දෙනු ලැබේ. පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ පැවති කාර්යක්ෂමතා කඩඉම සමත් III ශ්‍රේණියේ නිලධරයන් පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

කේ. වී .පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

රාජ්‍ය පරිපාලන, හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

08 - 300

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.